DEPARTMENT

No 07 ... Colombo 07

4/10/ඉඩම/2003/03

... ඉඩම් කොමසාරිස් වරුන් /ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

(7)

**ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී හමුදා සහ පොලිස් සේවයේ ආබාධිත වූ සහ මියගිය නිලධාරීන්ගේ පවුල්වල යැපෙන්නන්ටද, දැනට සේවයේ යෙදී සිටින හමුදා සහ පොලිස් සේවාවන්හි නිලධාරීන්ට ද නිවාස සඳහා**

**<u>රජයේ ඉඩම් ලබාදීමේ වැඩපිළිවෙල</u>**

ඉහත සඳහන් නිලධාරීන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා රජයේ ඉඩම් ලබාදීමේදී ගෙවිය යුතු ක්‍රියා ... කරමින් අතිගරු ජනාධිපතිතුමිය විසින් 2002.12.26 දින ඉදිරිපත් කරන ලද ... පත්‍රිකා අංක 02/2369/100/043 ට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව ත්‍රිවිධ හමුදාවන්හි හෝ පොලිස් සේවයේ නියුතු නිලධරයන් අතුරින් හමුදාපතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් නිර්දේශ කරනු ලබන අය සඳහා ඉඩමේ තක්සේරු වටිනාකමින් 10% ක් පමණක් අයකර ඉඩම් ලබාදීමටත්,

දැනටමත් ඉඩම් ලබාදී ඇති අයගෙන් 10% ක වටිනාකම පමණක් අයකර ගෙවීමට ඇති ඉතිරි මුදල් කපා හැරීමටත්,

තීරණය කර ඇත. මෙ සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 13 වැනි වගන්තිය යටතේ ... වරයා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත පරිදි කටයුතු කිරීමට එකඟත්වය දී ඇති බැවින් ... අනුව කරුණාකර කටයුතු කරන්න.

මෙහිදී ඉඩමේ වටිනාකමින් ගෙවිය යුතුව ඇති 10% ක මුදල එකවර ගෙවන්නේ නම් දීමනා ... යටතේ ඉඩම ලබා දීමට කටයුතු කළ යුතුය. එකී මුදල වාරික වශයෙන් ගෙවන්නේ නම් පළමුව ... බද්දක් යටතේ ඉඩම ලබාදී නියමිත මුදල ගෙවා නිම කළ පසු දීමනා පත්‍රයක් ලබා දීමට ... යුතුය.

එස්.ජේ.පතිරණ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:-

1. ජනාධිපති ලේකම්.
2. රාජ්‍ය ආරක්ෂක ලේකම්.
3. කෘෂිකර්ම , පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග ලේකම්
4. සියළුම හමුදාපතිවරුන්
5. පොලිස්පති.
6. දිස්ත්‍රික් ලේකම්වරුන්
7. ප්‍රාදේශීය කාර්යාල වල සියළුම මාණ්ඩලික නිලධාරීන්